වත්තල ප්‍රාදේශීය සභාව
ගම්පහ දිස්ත්‍රික්කය
--------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**
--------------------

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
--------------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මාර්තු 03 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි 31 දින ද, විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 සැප්තැම්බර් 30 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 **තත්ත්වාගණනය කළ මතය**
------------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට වත්තල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
----------------------------------------------------

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**
---------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | තොග ගබඩා සත්‍යාක්ෂණ වාර්තාව අනුව රු.5,483,303 ක් වූ පොදු ගබඩා තොගය මූල්‍ය ප්‍රකාශනවල රු.6,502,396 ක් ලෙස පෙන්වීම නිසා රු.1,019,093 කින් තොගය වැඩිපුර දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කරමි. |
| (ආ) | පරණඅම්බලම ප්‍රජාශාලාව ඉඩමේ වටිනාකම ස්ථාවර වත්කම් ලේඛනයට අනුව රු.335,391 ක් වුවත් එය රු.60,000 ක් ලෙස ප්‍රාග්ධනිත කර තිබුණි. | නිවැරදි වටිනාකම ප්‍රාග්ධනිත කළයුතු වේ. | ඉදිරියේදී නිවැරදි කරමි. |
| (ඇ) | ණයහිමියන් 02 දෙනෙකුට අදාලව රු.133,857 ක් වැඩිපුර ගිණුම්ගතකර තිබුණු අතර ණය හිමියන් 03 දෙනෙකුට අදාලව රු.72,050 ක් අඩුවෙන් ගිණුම්ගතකර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | උපලේඛන නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වැටුප් රහිත නිවාඩු වෙනුවෙන් අයවියයුතු රු.439,879 ක් ණයගැති ලෙස පෙන්වා නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | අයවිය යුතු වටිනාකම ණයගැති ලෙස වෙන් කිරීමට කටයුතු කරමි. |
| (ඉ) | සැපයුම් හා උපකරණ හා ප්‍රාග්ධන උපකරණ වැය ගිණුම් ශේෂ පිළිවෙලින් රු.750,000 ක් හා රු.10,000 ක් අඩුවෙන් ආදායම් වියදම් ගිණුමේ පෙන්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඊ) | ප්‍රාදේශීය සභාව සතුව පවතින විදුලි සෝපානය අගය කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | 2020 වර්ෂයේ නිවැරදි කරමි. |

1.3.2 **විගණනය සඳහා අවශ්‍ය සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.293,684,281 ක් වූ ගිණුම්විෂයයන් 06 ක් සත්‍යාපනය කිරීම සඳහා අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකෙරුණි. | පෙන්වා දී ඇති විගණන සාක්ෂි විගණනය සඳහා ගිණුම් සමග ඉදිරිපත් කළයුතු වේ. | 2020 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

1.3.3 **නොසැසඳුනු ගිණුම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශන අනුව ගිණුම් විෂයයන් 05 ක ශේෂ එකතුව හා එම උපලේඛන අනුව එකතුව අතර රු.37,681,502 ක වෙනසක් විය. | ලේඛන හා උපලේඛන නිවැරදි කිරීමට කටයුතු කළයුතු වේ. | 2020 දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | සේවක ණය ලේඛනය අනුව රු.595,753 ක් අඩුවෙන් දක්වා තිබුණි. තවද 2019 දෙසැම්බර් 06 දින සේවකයින් 93 දෙනෙකුට ලබාදී තිබූ රු.930,000 ක උත්සව අත්තිකාරම් ද උපලේඛනයට ඇතුලත්ව නොතිබුණි. | ලේඛන හා උපලේඛන නිවැරදි කිරීමට කටයුතු කළයුතු වේ. | දැනටමත් නිවැරදි කිරීමට කටයුතු අරම්භ කර ඇත. |

1.4 **අනුකූල නොවීම්**

1.4.1 **නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 24(1)(ආ) වගන්තිය | සභා බල ප්‍රදේශයට අයත් මංමාවත් පවරාගෙන නොතිබුණු අතර සභාව සතු මාර්ග ප්‍රමාණය 1909 ක් වුවද ඒවා ගැසට් කර නොතිබුණි. | පනත ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | සභාව සතු මාර්ග 30ක් ගැසට් කිරීම සඳහා මැනුම් කටයුතු කරමින් අවසන් අදියරේ පවතී. |
| | 219 වගන්තිය | ප්‍රාදේශීය සභාවක කිසිම සභිකයෙකු හෝ සේවකයෙකුට ප්‍රාදේශීය සභාව සමග ඇතිකරන ලද යම් ගිවිසුමක හෝ වැඩයක මූල්‍ය සම්බන්ධතාවයක් කෙලින්ම හෝ අන්‍යාකාරයකින් නොතිබියයුතු වුවද, සභිකයෙකුගේ බිරිඳට උත්සව ශාලාව බදුදී තිබූ අතර එයින් 2009 මැයි 30 දින සිට රු.974,800 ක බදු කුලී ශේෂයක් අයවියයුතුව තිබුණි. | පනත ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 193 | අයවැයගත මූල්‍ය ප්‍රතිපාදන හා පරිපූරක සම්මත හා සසඳා එක් එක් ආදායම් හා වියදම් විෂයයන් යටතේ ඌනතාවයන්, අතිරික්ත හෝ ඉතිරිකිරීම් පිළිබඳ කරුණු පැහැදිලි කරන ප්‍රකාශයක් විගණනය සඳහා ඉදිරිපත්කර නොතිබුණි. | ප්‍රාදේශීය සභා රීති ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | 2020 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිළියෙළ කර විගණනය සඳහා ඉදිරිපත් කරමි |
| (ඇ) | ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | රු.2,405,622 ක් වූ වර්ෂ 2 ඉක්මවූ තැන්පතු සම්බන්ධයෙන් කටයුතුකර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී එම තැන්පතු සභා අරමුදලට ගැනීමට කටයුතු කරමි |

1.5 **ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ**

(අ) **ලැබිය යුතු ශේෂ**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2019 දෙසැම්බර් 31 දිනට විවිධ ණයගැති ශේෂය තුළ වර්ෂ 5-10 අතර රු.974,800 ක්, වර්ෂ 1-3 අතර රු.6,713,002 ක් හා වර්ෂයකට වඩා අඩු රු.68,676,751 ක් විය. | ලැබියයුතු ශේෂ කඩිනමින් අයකරගැනීමට කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී අයකරගැනීමට කටයුතු කරමි. |
| (ii) | කර්මාන්ත වෙනුවෙන් 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා ලැබිය යුතු රු.6,713,002 ක් ලැබී නොතිබුණි. | ලැබියයුතු ශේෂ අයකිරීමට කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී අයකරගැනීමට කටයුතු කරමි. |

(ආ) **ගෙවිය යුතු ශේෂ**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2019 දෙසැම්බර් 31 දිනට ණයහිමි ශේෂය තුල වර්ෂ 5-10 අතර රු.64,774 ක්, වර්ෂ 1-3 අතර රු.49,146,947 ක් හා වර්ෂ 1ට අඩු රු.134,040,433 ක් විය. | නිරවුල් කිරීමට කටයුතු කළයුතු වේ. | නිරවුල් කිරීමට කටයුතු කරමි. |
| (ii) | 2013 වර්ෂයේ සිට ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට ගෙවියයුතු රු.64,774 ක් හා 2016 වර්ෂයේ හිඟ වරිපනම් එකතු කිරීම වෙනුවෙන් ගෙවිය යුතු රු.157,012 ක කොමිස් මුදල් නිරවුල්කර නොතිබුණි. | ගෙවියයුතු මුදල් නිරවුල් කිරීමට කටයුතු කළයුතු වේ. | 2016 වර්ෂයේ හිඟ වරිපනම් එකතු කිරීම සම්බන්ධයෙන් පවතින විමර්ශනයේ අවසන් තීරණය මත රු.157,012 ක කොමිස් මුදල පිළිබඳව කටයුතු කරමි. |
| (iii) | 2008 වර්ෂයේ සිට ජලකර්මාන්ත ගබඩාව ලෙස නම්කල හඳුනා නොගත් රු.729,708 ක ශේෂයක් හා රු.22,175 ක තාවකාලික විශ්‍රාම වැටුප් ගිණුම ලෙස නම්කල බැරශේෂයක් නිරවුල් කිරීමකින් තොරව දිගින් දිගටම ඉදිරියට ගෙනැවිත් තිබුණි. | හඳුනා නොගත් ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළයුතු වේ. | 2020 අවසන් ගිණුම සැකසීමේදී නිරවුල් කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.22,483,963 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.93,428,047 ක් විය.

## 2.2 මූල්‍ය පාලනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභා අරමුදල් ප්‍රදේශයේ ජනතාවට උපරිම ප්‍රතිලාභ ලැබියහැකි පරිදි සැලසුම් සහගතව වැයකිරීම සභාවේ අරමුණ වුවද, රුපියල් මිලියන 64.23 ක් පූර්ව සැලසුමකින් තොරව ස්ථාවර තැන්පතු 20 ක ආයෝජනය කර තිබුණි. | ප්‍රතිපාදන වලින් උපරිම ප්‍රතිලාභ ලබාගතයුතු වේ. | 2020 වර්ෂයේදී උපරිම ප්‍රතිලාභ ලැබෙන පරිදි වැය කිරීමට බලාපොරොත්තු වේ. |
| (ආ) | හැඳල වෙළඳ සංකීර්ණයේ උත්සව ශාලාව සඳහා ලැබිය යුතු කුලිය වෙනුවෙන් 2014 වර්ෂයේදී ලද රු.974,800 ක් වටිනා චෙක්පත අගරු වී තිබුණද මුදල් ලැබී නොතිබුණි. | ලැබියයුතු ආදායම් ඒ ඒ දින වකවානු වල අයකරගැනීමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්,රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 වර්ෂය | | | | 2018 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිගය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිගය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 81,888,000 | 93,055,708 | 94,277,899 | 57,770,373 | 78,650,700 | 87,885,932 | 95,446,728 | 58,992,564 |
| බලපත්‍ර ගාස්තු | 6,076,700 | 8,478,117 | 8,021,476 | 6,528,760 | 2,700,000 | 2,160,330 | 2,160,330 | - |
| කුලී | 2,850,000 | 2,752,411 | 2,752,411 | - | 4,000,250 | 4,508,171 | 4,981,498 | 6,072,119 |
| වෙනත් ආදායම් | 108,501,057 | 49,912,427 | 49,912,427 | - | 148,821,550 | 183,357,043 | 183,357,043 | - |
| | 199,315,757 | 154,198,663 | 154,964,213 | 64,299,133 | 234,172,500 | 277,911,476 | 285,945,599 | 65,064,683 |

2.3.2 **වරිපනම් හා බදු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| හැඳල උප කාර්යාලයේ හිඟ වරිපනම් බදු රු.200,000 ට වැඩි ඒකක 04 ක්ද, රු.100,000 ට වැඩි වරිපනම් ඒකක 07 ක්ද, රු.75,000 ට වැඩි ඒකක 07 ක්ද, රු.60,000 ට වැඩි ඒකක 01 ක්ද විය. | හිඟ වරිපනම් බදු අයකිරීමට කටයුතු කළයුතු වේ. | හිඟ වරිපනම් අයකිරීමට කටයුතු කරගෙන යනු ලබයි. |

2.3.3 **පරිසර බලපත්‍ර ආදායම**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පරිසර බලපත්‍ර වලින් රු.100,000 ක් ලබා ගැනීමට ඇස්තමේන්තුකර තිබුණි. එහෙත් උප කාර්යාල තුනටම අදාලව පරිසර බලපත්‍ර ලබාගතයුතු සියළුම ආයතන හඳුනාගැනීමක් සිදුකර නොතිබුණි. | පරිසර බලපත්‍ර ලබාගතයුතු ආයතන හඳුනාගෙන ආදායම ලබාගැනීමට කටයුතු කළයුතු වේ. | නොපමාව ක්ෂේත්‍ර පරික්ෂාවක් සිදුකර පරිසර බලපත්‍ර ලබා දීම පිළිබඳව දැඩි අවධානයක් යොමු කරන ලෙස අදාළ අංශ දැනුවත් කළෙමි. |
| (ආ) | ආයතන 05 ක පරිසර බලපත්‍ර අවලංගු වී තිබුණද අළුත් කරවා ගැනීමට අයදුම්පත් ඉදිරිපත්කර නොතිබුණි. | පරිසර බලපත්‍ර ලබාදීම හා ඒ සම්බන්ධ පසු විපරම් සිදුකළයුතු වේ. | බලපත්‍ර ලබා දීම පිළිබඳව දැඩි අවධානයක් යොමු කරන ලෙස අදාළ අංශ දැනුවත් කළෙමි. |

2.3.4 **සම්ප්‍රේෂණ කුළුණු ආදායම**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සම්ප්‍රේෂණ කුළුණු 35 ක් හඳුනාගෙන තිබුණත් කුළුණු වලට සවිකරන ලද තරංග හුවමාරු උපකරණ අයත් ආයතන වලින් ව්‍යාපාර බදු අයකිරීමට පියවර ගෙන නොතිබුණි. | අදාල ආදායම් අයකිරීමට කටයුතු කළයුතු වේ. | 2021 වර්ෂය සඳහාවන වාර්ෂික බදු පැනවීමේදී ව්‍යාපාර බදු යටතේ සම්ප්‍රේෂණ කුළුණුවලින් ව්‍යාපාර බදු අය කිරීම සඳහා අදාල උපලේඛනයට ඇතුළත් කිරීමට කටයුතු කරමි. |
| (ආ) | හැඳල උප කාර්යාලයේ කුළුණු 13 කින් රු.244,802 ක කුළුණු ආදායම් හිඟව තිබුණි. | හිඟ ආදායම් අයකිරීමට කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී අයකරමි. |

2.3.5 **හිඟ කඩකුලී**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| හැඳල උප කාර්යාලයට අයත් කෙරවලපිටිය කඩකාමර 25 කින් 2012 වර්ෂයේ සිට 2019 සැප්තැම්බර් 30 දක්වා රු.මිලියන 2.57 ක් හා කෙරවලපිටිය වෙළඳ සංකීර්ණයේ මුද්‍රාතැබූ කඩ 16 කින් 2012 සිට 2017 දක්වා රු.මිලියන 3.69 ක් හිඟව පැවතුණි. | හිඟ ආදායම් අයකිරීමට කටයුතු කළයුතු වේ. | නිරවුල් කිරීමට කටයුතු කරමි. |

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **කාර්යසාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය සහ සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිලිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) **අතුරු ව්‍යවස්ථා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 21 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2019 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 12 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවාගෙන තිබුණි. | සභාවට අදාලවන අතුරු ව්‍යවස්ථා වැළඳ ගැනීමට කටයුතු කළයුතු වේ. | 2020 වසරේ දී කාරණා කිහිපයක්ම සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා වැළඳ ගැනීමට අවධානය යොමු කර ඇත. |

(ආ) **ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව නිමකළයුතු කර්තව්‍යයන් 06 ක් සමාලෝචිත වර්ෂයේ අවසන් දිනය වන විටත් ඉටුකර නොතිබුණි. | සැලැස්මට අනුව කටයුතු කළයුතු වේ. | ප්‍රතිපාදන වෙන්වී නොමැති නිසා ඉටුකිරීමට නොහැකි විය. |

(ඇ) **අත්හැර දැමූ කර්තව්‍යයන්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2019 වර්ෂයේ ප්‍රාදේශීය සභාවට ගම්පෙරළිය සංවර්ධන ව්‍යාපෘති යටතේ ලැබුණු කර්මාන්තවලින් ව්‍යාපෘති 246 න් 37 ක් අත්හැරදමා තිබුණි. | ප්‍රතිපාදන නොමැති ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන සලසා ගත යුතු වේ. | ක්‍රියාත්මක නොකර ඇති ව්‍යාපෘති හා ගිවිසුම් ගත වී නොමැති ව්‍යාපෘති 37 ඉටුකිරීමට නොහැකි විය. |

(ඈ) **අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| හැඳල සෝසාතක ස්ථානය පිහිටි ඉඩමේ 2014 වර්ෂයේ රු.ලක්ෂ 20ක් වැයකරමින් ගොඩනැගිල්ලක්ද සාදා තිබූනද ගොඩනැගිල්ලෙන් කිසිදු ප්‍රතිලාභයක් අත්කරගෙන නොතිබුණි. | සභාවට ප්‍රතිලාභ ලබාගතහැකි කාර්යයකට යෙදවීමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. |

(ඉ) **පාරිසරික ගැටළු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පාරිසරික ගැටළු සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේදී මහජන පැමිණිලි 217 ක් ලැබී තිබූ අතර එයින් 73 ක් නොවිසඳී තිබුණි. | නොවිසඳී ඇති මහජන පැමිණිලි සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමුකළයුතු වේ. | මහජන පැමිණිලි සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කර ඇත. |

(ඊ) **තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම වෙනුවෙන් ගෝලීය දර්ශක තුලින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන | අදාල සැලසුම් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළයුතු වේ. | 2019 වර්ෂයේ රටතුළ පැවති අනාරක්ෂිත තත්ත්වය හේතුවෙන් එම වර්ෂයට නියමිත වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ |

| | | |
|---|---|---|
| තත්ත්වය හා සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් කිසිවක් 2019 වර්ෂය වෙනුවෙන් ක්‍රියාත්මක කර නොතිබුණි. 2019-2023 දක්වා තිරසර සංවර්ධන සංයුක්ත සැලැස්මක් සකස්කර තිබුණි. | | ගැටළු මතු විය. |

3.2 **මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

(අ) **සේවක පුරප්පාඩු**

-------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------------- | ---------------- | --------------------------------- |
| (i) | 2013 වර්ෂයේ සිට පුස්තකාලාධිපති තනතුරක්, 2013 හා 2017 වසරේ සිට ආදායම් පරීක්ෂක තනතුරු 02 ක්, 2018 වසරේ හා 2019 මාර්තු සිට කළමනාකරණ සහකාර තනතුරු 02 ක් හා 2013 සිට පෙරපාසල් ගුරු තනතුරක් පුරප්පාඩුව තිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කරගැනීමට කටයුතු කළයුතු වේ. | මෙම සියළු බඳවා ගැනීම් රාජ්‍ය සේවා කොමිෂන් සභාව යටතේ සිදුවන බැවින් සෑම කාර්තුවකදීම පුරප්පාඩු පිළිබඳ කාර්තු වාර්තා මගින් දැනුම් දී ඇත. |
| (ii) | ප්‍රාථමික සේවා ගණයේ සෞඛ්‍ය කම්කරු 12 ක් හා වැඩ ක්ෂේත්‍ර කම්කරු 35 දෙනෙකුට ස්ථිර පත්වීම් ලබාදී තිබුණද, අනුමත කාර්යය මණ්ඩලයට ඇතුලත් කරගෙන නොතිබුණි. | අනුමත කාර්යමණ්ඩලය සංශෝධනය කරගැනීමට කටයුතු කළයුතු වේ. | මේ සම්බන්ධව කටයුතු කර ඇත. |

(ආ) **වැටුප් රහිත නිවාඩු**

-------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------------- | ---------------- | --------------------------------- |
| සේවකයින් 35 දෙනෙකු සමාලෝචිත වර්ෂයේ වැටුප් රහිත නිවාඩු දින 366 ක් ලබාගෙන තිබුණු අතර 2019 දෙසැම්බර් 31 දිනට අයවීමට ඇති මුදල රු.439,879 ක් විය. | ලැබියයුතු මුදල් අයකිරීමට කටයුතු කළයුතු වේ. | ඉදිරි මාසවලදී සියළු අයකර ගැනීම් සිදු කර ගැනීමට නියමිතය |

(ඇ) **සේවක ණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සේවය හැරගිය/ මියගිය නිලධාරීන් 17 දෙනෙකුගෙන් 2012 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා අයකරගත නොහැකි රු.70,100 ක ආපදා හා උත්සව අත්තිකාරම් ශේෂයක්ද, වර්ෂ 16 කට පෙර සිට පැවත එන නිලධාරීන් 07 දෙනෙකුගෙන් අයකරගත නොහැකි රු.94,380 කආපදා , විශේෂ හා උත්සව අත්තිකාරම් ශේෂයක් විය. | ලැබියයුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | විෂය භාර නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් හේතුවෙන් යාවත්කාලීන නොවූ සේවක ණය ලේඛනය හා උප ලේඛන තවත් නිලධාරියෙකුගේ සහය ඇතිව දැනටමත් නිවැරදි කිරීමට කටයුතු අරම්භ කර ඇත. |

3.3 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

(අ) **වරිපනම් බදු තක්සේරු ප්‍රතිශෝධනයක් සිදු නොකිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අවසන් වරට සභා බල ප්‍රදේශයේ නිශ්චල දේපල තක්සේරුව සිදුකර වර්ෂ 10 ක් ඉක්මගොස් තිබුණද තක්සේරු ප්‍රතිශෝධනයක් නොකිරීම නිසා සභා බල ප්‍රදේශයට අයත් දේපල 58,003 කින් වර්තමානයට සුදුසු ප්‍රතිශෝධිත තක්සේරු වටිනාකම් අයකර නොතිබුණි. | නිශ්චල දේපල විධිමත් පරිදි නව තක්සේරුවක් කළයුතු වේ. | ඉදිරියේදී තක්සේරුව ප්‍රතිශෝධනය සිදුකර ඒ අනුව ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ. |

(ආ) **ඉඩම් විකුණුම් මත බදු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභා බල ප්‍රදේශය තුල කට්ටිකර විකුණන ලද ඉඩම් සම්බන්ධයෙන් විකුණුම් මිල මත අයවියයුතු 1% ක ආදායම අයකිරීමේදී ආදායම් අංශයේ නිලධාරියෙකුගේ තක්සේරු මිල පදනම් කරගෙන මුදල් අයකරගෙන තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුල හැඳල උපකාර්යාලයේ ඉඩම් 05 ක් හා | සත්‍ය විකුණුම් මිල මත බදු මුදල් අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | කට්ටිකර විකුණන ඉඩම් සම්බන්ධයෙන් සොයා බලා නැවත අදාල තක්සේරුව මත 1% මුදල් අයකර ගැනීමට උපදෙස් ලබා දුනි. |

වැලිසර උප කාර්යාලයේ එක් ඉඩමක් විකිණීමෙන් රු.1,770,305 ක බදු මුදලක් අයකර තිබුණද සත්‍ය විකුණුම් මිල පදනම් කරගෙන නොතිබීමෙන් සභාවට සැලකියයුතු ආදායමක් අහිමිවී තිබුණි.

(ඇ) **කඩ කාමර බදුදීම**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | හැදල උප කාර්යාලයට අයත් කඩ කාමර 04 ක් 2007 වර්ෂයේ සිටද, කඩ කාමරයක් 2013 වර්ෂයේ සිටද, කඩ කාමරයක් 2017 වර්ෂයේ සිටද, කඩ කාමර 02 ක් 2016 වර්ෂයේ සිටද බදුදීමකින් තොරව පැවතුණි. | අපේක්ෂිත ප්‍රතිලාභ අත්පත්කර ගැනීමට ක්‍රියා කළයුතු වේ. | එම කඩ අවස්ථා කීහිපයකදීම ටෙන්ඩර් කර ඇති නමුත් ඉල්ලුම්කරුවන් ඉදිරිපත් නොවූ නිසා බදු දීමකින් තොරව සභාවේ ප්‍රයෝජනය සඳහා යොදා ගෙන ඇත. |

## 3.4 වත්කම් කළමනාකරණය

### 3.4.1 වත්කම් වලින් ලැබියයුතු ආදායම් ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රීතිපුර නාන ස්ථානයේ ජල ටැංකිය කඩා වැටී ජල සැපයුම ඇණ හිටීම නිසා 2014 ජුලි මාසයේ සිට ආදායම් ඇණහිට තිබුණි. එදින සිට මේ දක්වාම එය පිළිසකර කර ආදායම් උත්පාදනය කිරීම කෙරෙහි සභාවේ අවධානය යොමුකර නොතිබුණි. | සභාවට ලැබියයුතු ආදායම් ලබාගැනීමට කටයුතු කළයුතු වේ. | ප්‍රීතිපුර නාන ස්ථානයේ වතුර ටැංකිය නැවත අළුත්වැඩියා කර ආදායම් අයකර ගැනීම සඳහා කටයුතු සලසා ඇත. |

### 3.4.2 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතුව මුළු ළිං සහිත ඉඩම් 49 ක්ද, ක්‍රීඩාංගන 21 ක්ද, ප්‍රජා ශාලා 21 ක්ද, සුසාන භූමි 08 ක්ද, පොදු පහසුකම් ඉඩම් 09 ක්ද, වෙනත් ඉඩම් 39 ක්ද, භෞතිකව තහවුරු කර නොගත් ඉඩම් 13 ක්ද ලෙස මුළු ඉඩම් 160 ක් තිබුණත් ඉන් ඔප්පු සාදා තිබුණේ 78 කට පමණි. | අදාල ඉඩම් සඳහා අයිතිය තහවුරුකරගැනීමේ කටයුතු සිදුකළයුතු වේ. | ඉදිරියේදී එම ඔප්පු සකස් කිරිමට අවශ්‍ය ඉඩම්වල මැනුම් කටයුතු සිදු කිරීමට නියමිතය. |

3.4.3 **පවරා නොගත් වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව සතුව පවතින වාහන 06ක් පවරාගැනීමට කටයුතුකර නොතිබුණි. | අදාල වාහන පවරාගැනීමට කටයුතු කළයුතු වේ. | එම වාහන සියල්ල පවරාගැනීමේ කටයුතු නොපමාව සිදුකරමින් පවතී. |

3.4.4 **නිෂ්ක්‍රිය /ඌන උපයෝජිත වත්කම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | 2009 වර්ෂයේ සිට කැබ් රථයක් ද, 2013 වර්ෂයේ සිට ට්‍රැක්ටරයක් ද, 2017 ජනවාරි සිට ට්‍රැක්ටර් 04 ක් ද, අබලි/ගර්හිත තත්ත්වයෙන් හැඳල හා වැලිසර වාහන අංගනවල පැවතුණි. | වාහන අපහරණය සම්බන්ධයෙන් කඩිනම් පියවර ගතයුතු වේ. | අබලි ගර්හිත තත්වයේ පවතින වාහන වෙන්දේසි කිරීම සඳහා ඉදිරිපත් කර ඇත. |
| (ආ) | පළාත් පාලන අමාත්‍යාංශය මගින් 2014 නොවැම්බර් මාසයේදී සභාවට ලබාදී තිබූ ගැල්වනයිස් බට 132 ක් ඌන උපයෝජිතව පැවතුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | කරුණු සොයා බලා පසුව වාර්තා කරමි. |
| (ඇ) | පොදු පහසුකම් ලෙස සභාවට ලැබී තිබූ ඉඩම් 05 ක් කිසිම සංවර්ධන කටයුත්තකට යොදාගෙන නොතිබුණි. | පොදු පහසුකම් ලෙස ලැබී ඇති ඉඩම්වල සංවර්ධන කටයුතු සඳහා යොදාගතයුතු වේ. | ඉදිරියේදී සියළු පොදු පහසුකම් ඉඩම් සංවර්ධනය කිරීමට අවශ්‍ය කටයුතු සලසමි. |

3.4.5 **වත්කම් අන්සතු කිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 1988 වර්ෂයේදී ආචාර්ය නිකලස් මාකස් ප්‍රනාන්දු රදගුරු හිමිපාණෝ විසින් රු.188,000 වටිනාකමක් මත තෑගි ඔප්පුවකින් වත්තල ප්‍රාදේශීය සභාවට පිරිනමන ලද අක්කර 11 රූඩ් 02 පර්චස් 11 ක් විශාල උස්වැටකෙයියාව පාර්ස් | සභා දේපල ආරක්ෂා කරගතයුතු වේ. | විධිමත්ව පරික්ෂා කර බලා වාර්තා කරමි |

වත්ත ඉඩම, සභාපති හා ලේකම් විසින් 1991 වර්ෂයේදී ඉඩම් කොටස් 57 ක් හෝ ඊට ආසන්න සංඛ්‍යාවකට බෙදා තෑගි ඔප්පු මගින් ඉඩම අන්සතුකර තිබුණි.

### 3.5 හඳුනා ගත් පාඩු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ගබඩාවේ තිබූ යකඩ බාර් තොගයක් 2019 මැයි මස සොරාගෙන ගොස් තිබූ අතර මැයි 24 දින වත්තල පොලිස් ස්ථානයේ පැමිණිල්ලක් දමා තිබුණි. මේ පිළිබඳව පසු විපරමක් කර නොතිබුණි. | මේ පිළිබඳව සොයා බලා ඉදිරි නීතිමය කටයුතු කළයුතු වේ. | වත්තල පොලිස් ස්ථානයේ ස්ථානාධිපති විසින් ඒ සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු සිදුකරයි. |

### 3.6 ප්‍රසම්පාදනය

#### 3.6.1 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2006 ජනවාරි 25 දිනැති ජාතික ප්‍රසම්පාදන චක්‍රලේඛ අංක 8 හි 4.2.1 (b) හා (c) පරිදි ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම හා වාර්ෂික විස්තරාත්මක සැලැස්ම පිළියෙලකර නොතිබුණි. | අදාල චක්‍රලේඛ ප්‍රකාරව සැලැස්ම පිළියෙල කළයුතු වේ. | අදාළ චක්‍රලේඛය ප්‍රකාරව සැලැස්මක් සකස් කිරීම සඳහා අවධානය යොමු කරමි. |